ආරක්ෂාව

අගමැති මහින්ද රාජපක්ෂ මහතා දිනෙන් දිනම කොටින්ගේ තර්ජනයට ලක්වන බවට ජාතික ආරක්ෂක මණ්ඩලය වෙත දිගට හරහට බුද්ධි තොරතුරු ගලා එන්නට පටන් ගෙන ඇත.

බුද්ධි අංශ වාර්තාවලට අනුව මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති ධූරයට පත්වීම වැළැක්වීම කොටි සංවිධානයේ ප්‍රධානම අරමුණය.

බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික හෙළ උරුමයත් සමග අත්වැල් බැඳ ගැනීමත් සමඟ හෙතෙම කොටින්ගේ ප්‍රධාන ඉලක්කය බවට පත්වී හමාරය. කොළඹ පිහිටි ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයේදී (Joint Operation Headquarters) ඉකුත් 20 දා පස්වරුවේ පැවැති ආරක්ෂක ප්‍රධානීන්ගේ විශේෂ රැස්වීමකදීත් හෙළිවුයේද මෙම තර්ජනය ගැනය.

මහින්ද රාජපක්ෂ මහතා කොටින්ගේ දැවැන්ත ඉලක්කයක් බවට පත්ව ඇතැයි මෙම සාකච්ඡාවට එක්වූ බුද්ධි අංශ ප්‍රධානීන් ආරක්ෂක මණ්ඩලයට අනතුරු හැඟවූහ. මෙයට ත්‍රිවිධ හමුදාපතිවරුන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි, පොලිස්පති යන ජෙෂෂ්ඨ ආරක්ෂක ප්‍රධානීන් ද එක්ව සිටියහ.

ජනාධිපතිවරණය පැවැත්වෙන දිනට පසුදින (නොවැම්බර් 18) යෙදෙන මහින්ද රාජපක්ෂ මහතාගේ උපන්දිනය සැමරීමට ඔහුට ඉඩ ලැබේද? (Will he celebrate his birthday?) යන්න කියා එල්.ටී.ටී.ඊ. ය ව්‍යංගයෙන් අනතුරු හැඟවීමක් කර ඇතැයි විදේශ බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ (D.F.I.) සහකාර අධ්‍යක්ෂක පොලිස් අධිකාරි එම්.ආර්. ලතිෆ් මහතා මෙහිදී බුද්ධි වාර්තාවක් ඉදිරිපත් කළේය.

මෙහිදී මීළඟට කියවුනේ අගමැතිවරයාට ජනාධිපතිවරණයේදී සහාය පල කිරීමට බව කියමින් සති දෙකකට පමණ පෙර අරලියගහ මන්දිරයට පැමිණි උතුරේ දෙමළ පුජකයන් හා දෙමළ නායකයින් සමග සිටි කොටි ඔත්තුකාරියක් විසින් අරලියගහ මන්දිරය ජංගම දුරකතනයේ වූ කැමරාවකින් වීඩියෝ ගත කරගෙන ගොස් ඇතිබවය.

මෙහිදී ගත් ඡායාරූප මගින් අරලියගහ මන්දිරයේ ආරක්ෂක හිඩැස් හඳුනා ගැනීමටත්, එහි අනුරූපක් (Modle) සකස් කර ප්‍රහාර එල්ල කිරීමට සැලසුම් යෙදිය හැකි බවත් බුද්ධි අංශ අනතුරු හැඟවූහ.

මෙහිදී හෙළිවූ වැදගත් කාරණය වූයේ කොටි ඔත්තුකාරිය ඇතුළු දෙමළ නායකයින් අරලියගහ මන්දිරයට රැගෙන ආවේ දෙමළ මාධ්‍යකරුවකු බවය. බුද්ධි අංශ වාර්තාවලට අනුව ඔහු කොටින්ට සහාය පල කරමින් ශ්‍රී ලංකාවේ විකාශය වන ප්‍රධාන පෙලේ පෞද්ගලික රූපවාහිනි නාලිකාවක දෙමළ වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙකි. ඔහු අගමැතිවරයාගේ මාධ්‍ය ආවරණ කටයුතුවලට අදාළ රූපවාහිනි චැනලය මගින් යෙදවූ අයෙකි.

වසර ගණනාවක සිටම අගමැතිවරයාගේ මාධ්‍ය ආවරණ කටයුතුවලට යොදවා ඔහුගේ හිත දිනා ගනිමින් අගමැතිවරයාට ලංවී සූක්ෂම ලෙස තම ඉලක්කය සපුරා ගැනීමට කොටි මෙහිදී සැලසුම් කර තිබිණි.

ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා ඝාතනය කිරීමට බාහු නමැති කොටියා ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ සමීප මිතුරකු බවට පත්කර සූක්ෂම ලෙස ඉලක්කය සපුරා ගත් ආකාරයට මෙම ඉලක්කයද යෙදුවේ මාධ්‍යවේදියකු ලෙස පෙනී සිටි බාබු කෙනෙකි.

එහෙත් බුද්ධි අංශ වාර්තා මගින් මේ පිළිබඳව හෙළිකිරීමත් සමග අගමැති ආරක්ෂක අංශය (PMSD) මගින් ඔහුට අරලියගහ මන්දිරය හහනම් කිරීමට සිදුවිය. එය හෙළිවීමත් සමග කොටි මාධ්‍යකරුවා හදිසියේම ශ්‍රී ලංකාව අතහැර කැනඩාවට පැන ගියේය. ඒ මීට දින ගණනාවකට ඉහතදීය.

මේ ආකාරයටම ජනාධිපතිනිය ඉලක්ක කරගෙන කොටි සන්නද්ධ නායකයකු වන ස්වර්ණමිගේ ගෝලයකු කොළඹ පිහිටි ප්‍රධාන පෙළේ දෙමළ පුවත්පතක ඡායාරූප ශිල්පියෙකු ලෙස පත්කර එවූ බවද බුද්ධි අංශ මීට මාස කිහිපයකට පෙර හෙළිකරගෙන තිබිණි. ඔහුද ජනාධිපතිනියගේ මාධ්‍ය ආවරණ කටයුතුවලට පැමිණෙන මුවාවෙන් පැමිණ කොටි සංවිධානයේ අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කල බව බුද්ධි අංශ හෙළිකර ගත්තේය.

මේ වනවිට ආරක්ෂක අංශවලට ඇති ප්‍රධානම වගකීම වී ඇත්තේ අගමැතිවරයාව කොටින්ගේ ඉලක්කයෙන් බේරා ගැනීමය.

විදේශ කටයුතු ඇමැති ලක්ෂ්මන් කදිරගාමර් මහතා කොටින්ගේ ඉලක්කයක් බවට පත්වූයේ ප්‍රභු ආරක්ෂාවේ ඇති මූලික සිද්ධාන්ත හරිහැටි ක්‍රියාත්මක නොකිරීම නිසාය. ප්‍රභුවරයාගේ ආරක්ෂාව භාරව සිටින ප්‍රභු ආරක්ෂකයින් ප්‍රභුවරයාට අවශ්‍ය ආකාරයට ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම නිසා ලක්ෂ්මන් කදිරගාමර් මහතා රැකසිට එල්ල කල වෙඩි ප්‍රහාරයකට ලක්විය.

මෙම ඝාතනයෙන් පසුව ස්නයිපර් ප්‍රහාරවලින් ප්‍රභුවරුන් බේරා ගැනීමට ප්‍රභු ආරක්ෂකයන්ගේ වැඩි අවධානය යෙදුනද මින් ඉදිරියට ප්‍රභුවරයා සිටින ස්ථානයට කඩාවැදි ප්‍රහාර එල්ල කිරීමට පවා කොටි පෙළඹිය හැකි බව බුද්ධි අංශ අනතුරු හඟවා හමාරය.

මෙම කොටි තර්ජන එන්න එන්නම වැඩිවෙද්දී මීලඟ ජනාධිපතිවරණයට පෙර රට තුළ යුද්ධය ව්‍යාපාරණයක් ඇති කරලීමේ කොටි සැලසුමක්ද හෙළිවිණි.

එය ක්‍රියාවට නංවමින් සෑම දිනකම ආරක්ෂක අංශවලට එරෙහිව ප්‍රහාර එල්ල කිරීමට කොටි සංවිධානය පටන් ගෙන ඇත. තැනින් තැන ප්‍රහාර එල්ල කරමින් ආරක්ෂක අංශ සාමාජිකයන් මරා දැමීමට හා තුවාල කිරීම මගින් දකුණේ ජනතාව තුළ යුධ බියක් ඇතිකරලීම කොටින්ගේ අරමුණයි

එමගින් මහින්ද රාජපක්ෂ මහතා බලයට පත්වීම නැවැත්වීම කොටින්ගේ සැලසුම වී ඇත. මීට අමතරව උතුරු නැගෙනහිර ජනතාවටද අගමැතිවරයා ජනාධිපතිවරයා ලෙස පත්වුවහොත් යළි යුද්ධයක් හට ගනිවි යැයි බොරු මවාපෑමක් කිරීමට කොටි කටයුතු කර හමාරය.

මේ සියලු කාරණා වෙද්දී සාමයට මුවාවී තම සන්නද්ධ බලය වැඩි කිරීමද කොටි සංවිධානය පියවර ගනිමින් සිටින බව බුද්ධි අංශ කියයි. කොටින්ගේ සන්නද්ධ බලය වැඩිකිරීමේ අරමුණින් දිනෙන් දින බඳවා ගැනිමද වැඩිකර ඇත.

මීට අමතරව යාපනයේ බලය ඇල්ලීමේ සැලසුම්කල් ක්‍රියාත්මක කරමින් සිටී. තමන්ට යාපනය අහිමි වූ ආකාරය පිළිබඳව කොටින්ගේ යුද විශ්ලේෂක අංශ ප්‍රධානි 'ශඉකුමාර් මාස්ටර්' විසින් කරන ලද විශ්ලේනෙයක් අනුව මෙම සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවති.

මේ වනවිට හමුදා පාලනය යටතේ ඇති යාපනය අර්ධද්වීපයට 'සෑම් 07' වර්ගයේ මිසයිල විදින දෙකක් ඇතුළු බර අවි රැසක් කොටි විසින් රැගෙන විත් ආරක්ෂිත නිවාස (Safe Houses) තුළ සඟවා ඇතැයි බුද්ධි අංශ හෙළිකර ඇත.

එමෙන්ම අධි ආරක්ෂිත කලාප (High Security Zone) තුලට තම සන්නද්ධ අංශ සාමාජිකයන් විවිධ ක්‍රම මස්සේ රිංගවා ඇත. අධි ආරක්ෂිත කලාප තුළ විවිධ ප්‍රහාර දියත් කර ආරක්ෂක හමුදා මානසිකව ඇද වැටිටවීම කොටින්ගේ අරමුණ බව පැහැදිලිය. මීලඟ සටනකදී අධි ආරක්ෂිත කලාප තුළ සිට ප්‍රහාර දියත් කිරීම මගින් ඉදිරි ආරක්ෂක වළලු (Forward Defence Line) වල සිටින සෙබළුන් මානසිකව වැටිටවීම මෙම සැලසුම්වල අරමුණය.

කෙසේ වෙතත් මේ දිනවල අධි ආරක්ෂිත කලාප ආසන්නයට එවන කොටි සාමාජිකයන් උවමනාවෙන්ම ආරක්ෂක අංශවල අත්අඩංගුවට පත්කර ඔවුන් හරහා කොටින්ගේ ප්‍රධාන පෙළේ ප්‍රභාරවල සැලසුම් හෙළිකර බොරු බියක් පැතිරවීමද පටන් ගෙන ඇත. ඉදිරි ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන මෙම සැලසුමද ක්‍රියාත්මක වී තිබේ. මීට පෙර පැවති මැතිවරණවලදීත් මේ ආකාරයට ආරක්ෂක අංශ වෙත උවමනාවෙන් හසුවන අයුරෙන් ආ කොටි සාමාජිකයන් ලවා යුද බියක් ඇතිකරලීමට කටයුතු කර තිබේ. මේවා කොටින්ගේ මනෝ මෙහෙයුම් (PSY-OP) බව ආරක්ෂක අංශවල මතයයි.

මේ සියල් කාරණා සැලකිල්ලට ගැනීමේදී හෙළිවන්නේ කොටි සංවිධානය දීර්ඝ කාලීන අරමුණක් වෙත ගමන් කරන බවකි. සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා භේද බින්න කර කොටි සංවිධානය තම දෙමළ ඊළාම් රාජ්‍යය වෙනුවෙන් අවසන් සටනක නිරත වන බව මොනවට පැහැදිලිය.

රජයත්, රජයේ හමුදාවනුත් සටන් විරාම ගිවිසුමකට සීමා කරන කොටි සංවිධානය තනි ගමනක යන බව මේ වනතෙක් සටන් විරාමය කඩකර ඇති ආකාරයෙන්ම පැහැදිලිය. රජයේ හමුදාවන් 'ගොරෝවාන්විත සාමය' යන වචනයට මුවාකර තම ගමනට එරෙහි වන සෑම අභියෝගයක්ම යටපත් කරමින් කොටි තමන්ගේ ඉදිරි ගමන ක්‍රියාත්මක කර ඇත. තම අරමුණ වෙනුවෙන් සෑම බාධකයක්ම ඉවත් කරමින් යන ඔවුන් තමන්ට පිළිලයක් වූ රජයේ බුද්ධි අංශයේ ලුතිනන් කර්නල් මුනාලින් ඇතුළු බුද්ධි නිලධාරීන් සමග ආරක්ෂක අංශ සාමාජිකයන් හැටක් (60) ද, කොටි විරෝධී දෙමළ පක්ෂ ඇතුළු සාමාන්‍ය වැසියන් 237 ක්ද මේ වනවිට ඝාතනය කර හමාරය.

කෙසේ වෙතත් ඔවුන්ට කරුණා අම්මාන්ගේ අභියෝගය තවමත් ජයගත නොහැකිවීම දකුණේ රජයටද වාසියක් වී ඇත. කරුණා පිල නැගෙනහිර බලය පතුරවන තුරු කොටින්ට තම ඊළාම් රාජ්‍යයේ නැගෙනහිර කොටස අහිමිය. මෙය කොටින්ට ඉදිරියේ ඇති දුරුණු අභියෝගයකි.

මෙම 24 වනදාට පෙර නැගෙනහිරින් ඉවත් නොවන වන්නි කොටින්ට කිසිදු සමාවක් නොදෙන බවත් මෙම 24 දායින් පසුව තම ප්‍රහාර අරඹන බවත් කරුණා පිල අත්පත්‍රිකා බෙදාහරිමින් කොටින්ට අභියෝග කළේද මේ අතරතුරදීය.

ඉදිරි ජනාධිපතිවරණයේදී තමන්ට වාසිවන අපේක්ෂකයකු පත්කර ගැනීමත්, නැගෙනහිර කරුණා බලය බිඳ දමා තම බලය පතුරවීමේ අභියෝගයටත් මේ වනවිට කොටි සංවිධානයට මුහුණදීමට සිදුවී ඇත. මෙය කෙසේ අවසාන වේදැයි අවිනිශ්චිතය.

■

කොටි ඔත්තුකාරියක් අරලියගහ මන්දිරයට ආවා ද?

ජනාධිපතිවරණය හා කොටි සැළසුම්

තිස්ස රවීන්ද්‍ර පෙරේරා

The Challenge

ඔබේ විවේකය විනෝදයෙන් ගත කරන්නට සන්නස අද සිට අරඹන විශේෂාංගයයි මේ. බැලූ බැල්මට මේ රූ සටහන් දෙකම එක සේ ය. නමුත් B රූ සටහන හා A රූ සටහන අතර වෙනස් කම් 10 ක් ඇත. ඔබ කළ යුත්තේ B රූ සටහනේ මේ වෙනස්කම් ලකුණු කර අප වෙත එවීමයි. ජයගන්නා එක් අයයකුට සීඩී තැටියක් හිමිවෙයි.

සිත්තම ලලිත් සේනානායක

නම .....

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න)

.....

.....

.....

පුරකථන අංකය .....